**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය**
தேசிய மொழிக்கல்வி மற்றும் பயிற்சி நிறுவனம்
**National Institute of Language Education and Training**

# ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ පුරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

මෙම ආයතනය 2007 අංක 26 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත අර්ධ රාජ්‍ය ආයතනයක් වන අතර, එහි පුරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## (01) අධ්‍යක්ෂ ජනරාල් - තනතුර 01

**කාර්යයන් :** කළමනාකරණ මණ්ඩලයේ මග පෙන්වීම සහ පාලනයට යටත්ව ආයතනයේ පරිපාලන සහ මූල්‍ය කටයුතු ඇතුළුව සියලුම ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කිරීම් හා පත්වීම් බලධරයා විසින් පවරනු ලබන රාජකාරී හා කාර්යයන් ඉටු කළ යුතුය.

**වැටුප් පරිමාණය :** HM 1-3 රු. 86,865.00 - 15x270 - 120,915.00

**අධ්‍යාපන සුදුසුකම් :**

- **බාහිර අයදුම්කරුවන් -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අධ්‍යාපන හෝ භාෂා විෂය ක්ෂේත්‍රයේ පළමු පෙළ උපාධියක් හා පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**පළපුරුද්ද -** ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ හෝ පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 18 ක සේවා පළපුරුද්දක් තිබීම හා යටත් පිරිසෙන් වසර පහක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ කටයුතු කර තිබීම.

**අතිරේක සුදුසුකම් -** වෙනත් වෘත්තීය සුදුසුකම් සහිත නව අදහස් ක්‍රියාවට නැංවිය හැකි ධනාත්මක ආකල්ප සහිත අයෙකු වීම.

- **අභ්‍යන්තර අයදුම්කරුවන් -**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ අධ්‍යක්ෂ තනතුරේ අවුරුදු 03 ක් සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**අතිරේක සුදුසුකම් -**

1. සිංහල හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළ ප්‍රවීණතාවයක් ලබා තිබීම.
2. තොරතුරු තාක්ෂණය පිළිබඳ පළපුරුද්ද තිබීම.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

**ඉහත තනතුර සඳහා වන පොදු කොන්දේසි :**

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලාංකීය පුරවැසියන් විය යුතුයි.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) නිලධාරියා සිය වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක වන අතර, සේව්‍යයා විසින් 12% ක් සේවක අර්ථසාධක අරමුදලට ද, 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ද ප්‍රදානය කරනු ඇත.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු පිළිවෙළ :**

ජීවදත්ත විස්තර හා ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක, විද්‍යුත් තැපැල් ලිපින සහ තැපැල් ලිපින ඇතුළත් තමන් විසින් සකස් කළ අයදුම්පත්‍රය, අධ්‍යාපන හා වෘත්තීය සහතික පිටපත් සමග 2024 පෙබරවාරි මස 02 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑල මගින් යොමු කළ යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය / රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය,**
**නො. 321/1A,**
**හයිලෙවල් පාර, මාකුඹුර,**
**පන්නිපිටිය.**